**ශීර්ෂය 103 ආරක්ෂක අමාත්‍යාංශය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය103 - ආරක්ෂක අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආරක්ෂක අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූනි 19 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ආරක්ෂක අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීයාගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 2.1.3 (අ) | අංක 01/2015 හා 2015 ජුලි 20 දිනැති රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ (05) ඡේදය හා මුදල් රෙගුලාසි 128(2)(එ) හි දැක්වෙන විධි විධාන ප්‍රකාරව අවශ්‍ය අවස්ථාවන්හි ආර්ථික තත්ත්වයේ වෙනස්කම් සැළකිල්ලට ගනිමින් නොයෙකුත් සේවාවන් සඳහා අයකරනු ලබන ගාස්තු කාලානුරූපිව සංශෝධනය කළ යුතු වීම. | 1.6.1 (අ) (v) |

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) ආදායම් ලැබීම්**

අමාත්‍යාංශයට අදාළ ආදායම් ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය තුල ආදායම් සංකේතාංක 20.03.06.00 එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් රාජකාරි ඉටුකිරීම වෙනුවෙන් ලද ආදායම් ලෙස ශ්‍රී ලංකා යුධ හමුදාව හා ගුවන් හමුදාව පිළිවෙලින් එක්සත් ජනපද ඩොලර් 8,211,373.98 හා 10,965,751.85 ක් ලෙස එකතුව එක්සත් ජනපද ඩොලර් 19,177,125.83 ක් රැස්කර ඇතත්, ඒසීඒ -1 ආදායම් ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස එක්සත් ජනපද ඩොලර් 7,506,868.47 ක් හෙවත් රු.2,447,153,974 ක් පමණක් දක්වා තිබුණි. තවද මෙම ආදායමින් එක්සත් ජනපද ඩොලර් 8,057,402.58 ක් 2022 දෙසැම්බර් 31 දිනෙන් පසුව රාජ්‍ය ආදායමට බැරකර තිබුණු අතර එක්සත් ජනපද ඩොලර් 3,612,804.78 ක් ණයවර ලිපි විවෘත කිරීමේ පහසුව සඳහා භාණ්ඩාගාර එකඟතාව මත යුධ හමුදා විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක රඳවා ගෙන තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයට අදාල ආදායමෙන් එක්සත් ජනපද ඩොලර් 11,670,207.36 ක ආදායමක් ගිණුම් තුලින් නිරූපනය නොවුණි. 2022 දෙසැම්බර් 31 දිනට | ශ්‍රී ලංකා යුද්ධ හා ගුවන් හමුදාවේ විදේශ ව්‍යවහාර ගිණුම් (**NRFC**) තුළ භාණ්ඩාගාරය වෙත යොමු කරන තෙක් රඳවා ගනු ලබන අතර, මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය මත එම රඳවාගනු ලබන ආදායම, හමුදාවන් දෙක වෙනුවෙන් කරනු ලබන ඩොලර් වියදම් දැරීමේදී 20.03.06.00 දරන ආදායම් ශීර්ෂය වෙත බැර කර අදාළ ගෙවීම් සිදු කරනු ලැබේ.<br>මෙලෙස විදේශ ව්‍යවහාර ගිණුම වෙත බැර කරනු ලබන ආදායමෙන් අදාළ සාම සාධක හමුදාවන්ගේ වැටුප් හා වේතන වෙනුවෙන් වැය දැරීමක් සිදු කරන අතර, කිසිදු අවස්ථාවක එම ඩොලර් වටිනාකම මුදල් අමාත්‍යාංශය හරහා අදාළ ආදායම් ශීර්ෂය වෙත බැර කිරීමක් සිදු නොවේ.<br>මින් ඉදිරියට ආදායම් ගිණුම් පිළියෙල කිරීමේදී මෙලෙස සිදුවන වෙනස්වීම් පිළිබඳ සටහනක් මඟින් කරුණු දැක්වීමක් සිදු කරන බවත් පෙන්වා දෙමි. | මු.රෙ.128(2) (ආ) සහ මු.රෙ.151 ප්‍රකාශය පිළියෙල කරනු ලබන වර්ෂය සඳහා ඇස්තමේන්තු කර තිබෙන රාජ්‍ය ආදායමද එම වර්ෂයේ නියම වශයෙන් එකතු කරන ලද රාජ්‍ය ආදායමද ආදායම් ගිණුම තුළ පෙන්නුම් කළ යුතු අතර 1/2015 රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය ප්‍රකාරව එකතු කරනු ලබන ආදායම් රැස්කිරීමේ ගිණුම් වල හෝ තැන්පතු ගිණුම්වල තබාගැනීමෙන් වැලකී සිටිය යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | පැවති විනිමය අනුපාත අනුව එම අගය රු. 4,205,942,733 ක් විය. තවද මෙම රදවාගත් ආදායම පිළිබඳව මුල්‍ය ප්‍රකාශන තුලින් අනාවරණය කර නොතිබුණි. | | |
| **(ii)** | 2022 මූලික ආදායම් ඇස්තමේන්තුව අනුව ආදායම් ශීර්ෂ 10.03.07.05 - බලපත්‍ර ගාස්තු ආදායම රු. 22,050,000 ක් ලෙස ඇස්තමේන්තු කර තිබූ අතර අමාත්‍යාංශය විසින් 2022 ජූලි 29 දින රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව මගින් රු. 28,890,000 ලෙස සංශෝධනය කර තිබුණි. එසේම 2022 සංශෝධිත අතුරු අයවැය අනුව මෙම සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු. 22,000,000 ක් ලෙස තවදුරටත් සංශෝධනයකර තිබුණු නමුත් වර්ෂයේ තථ්‍ය ආදායම රු.42,416,904 ක් වූයෙන් ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම අතර වෙනස රු.20,416,904 ක් විය. එය සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව මෙන් සියයට 93ක් වූ බැවින් බලපත්‍ර ගාස්තු ආදායම ඇස්තමේන්තු කිරීම දෝෂ සහගත බව නිරීක්ෂණය විය. | 2022 වර්ෂයේ ඇස්තමේන්තු ගත ආදායම හා තථ්‍ය ආදායම අතර වෙනසට පහත සඳහන් කරුණුද හේතු විය හැකි බව දන්වමි.<br>• 2022 වර්ෂය සඳහා බලපත්‍ර අලුත් කිරීමේ කාලය දීර්ඝ කිරීම හා 2023 වර්ෂය සඳහා බලපත්‍ර අලුත් කිරීම 2022 ඔක්තෝබර් 01 ආරම්භ වී 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වීම.<br>• වගා ආරක්ෂාව සඳහා ගිනිඅවි ලබාදීමේදී වගා අක්කර ප්‍රමාණය 05 සිට 02 ක දක්වා අඩුකිරීම හේතුවෙන් බලපත්‍ර ඉල්ලුම වැඩිවීම.<br>• අන්තරායකාරි බහාලුම් සහිත නැව් මෙහෙයුම් ගාස්තුව රු.1500/- සිට රු.5000/- ක් දක්වා සංශෝධනයට ලක්වීම හා සමුද්‍රාරක්ෂක මෙහෙයුම් කටයුතු සඳහා වන ගාස්තුව . රු. 5000 සිට රු.10000 ක් දක්වා සංශෝධනයට ලක්වීම. | ආදායම් ප්‍රක්ෂේපණයන් හැකිතාක් නිවැරදිව සිදුකිරීමට කටයුතු කල යුතුයි. |
| **(iii)** | එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් කටයුතුවලින් 2022 දෙසැම්බර් 31 දිනට එ.ජ.ඩොලර් 4,545,589.43 ක් හිඟ හිටව පැවති අතර එයින් එ.ජ.ඩොලර් 344,559 ක් වසරකට වැඩි කාලයක සිට හිඟහිටව පැවතුණි. | මෙම හිඟ හිටි ආදායම කඩිනමින් අයකර ගැනිමට එක්සත් ජාතීන්ගේ නිත්‍ය නියෝජිත කාර්යාලය දැනුවත් කර අවශ්‍ය පියවර ගන්නා ලෙස ගුවන් හමුදාව වෙතද දැනුවත් කර ඇත. | හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කිරීම හා ඒ සම්බන්ධ පසුවිපරම් කටයුතු අඛණ්ඩව සිදු කළ යුතුය. |
| **(iv)** | පුපුරණ ද්‍රව්‍ය හා තුවක්කු බලපත්‍ර ගාස්තු, ආරක්ෂක නියෝජිත ආයතන විධිමත් කිරිමේ ගාස්තු වෙනුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ආදායම රු. 2,582,270 ක් විය. එයින් රු. 1,326,890 ක් වසරකට වැඩි කාලයක සිට සහ රු. 942,690 ක් වසර 02 කට වඩා වැඩි කාලයක සිට හිඟහිට පැවතුණි. | මෙම හිඟ ආදායම් අයකර ගැනීම සඳහා අතිරේක ලේකම් (සිවිල් ආරක්ෂක හා සංවර්ධන)වෙත දැනුම් දී ඇති අතර, මේ වන විට හිඟ ආදායම් අයකර ගැනීම සඳහා සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල දැනුවත් කර ඇත. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් මෙම හිඟ ආදායම් අයකර ගැනිමට ගෙන ඇති පියවර සිවිල් ආරක්ෂක හා සංවර්ධන අංශය මඟින් දැනුම් දී ඇත. | හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කිරීම හා ඒ සම්බන්ධ පසුවිපරම් කටයුතු අඛණ්ඩව සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(v)** | මුදල් රෙගුලාසි 128(2)(ඇ) හා 1/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය ප්‍රකාරව විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලද 2022 දෙසැම්බර් 31 දිනට හිඟ ආදයම් ප්‍රකාශයෙහි සහ ACA – 1(i) ආකෘතියෙහි හිඟ හිටි ආදායම අතර රු. 626,500 ක වෙනසක් නිරීක්ෂණය වු අතර 2019 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි බලපත්‍ර ගාස්තු ආදායම ACA –1(i) ආකෘතියෙහි දක්වා නොතිබීම මෙම වෙනසට හේතු වී තිබුණි. | ඉදිරියේදී පෙර වර්ෂයන්හි හිඟ ශේෂයන් ද එකතු කර මෙම අගය ගණනය කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 128(2)(ඇ) හා 1/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය ප්‍රකාරව හිග ආදයම් ප්‍රකාශයෙහි නිවැරදි හිග හිටි ආදායම දැක්විය යුතුය. |
| **(vi)** | 2019 වර්ෂය තුළ රැස්කල ශුද්ධ ආදායම රු.21,372,185,188 ක් වුවත්, ACA–1(i) ආකෘතියෙහි පසුගිය වර්ෂ 03හිදී රැස්කල ශුද්ධ ආදායම දැක්වීමේදී 2019 වර්ෂය තුළ රැස්කල ශුද්ධ ආදායම රු.2,802,302,525 ක් ලෙස දක්වා තිබුණි. | ආසන්න පූර්ව වර්ෂ 03 හි ශුද්ධ ආදායම අවසාන ගිණුම් ප්‍රකාශයේ දැක්වීමේදී අතපසුවීමෙන් මෙය සිදුවී ඇති බැවින් ඉදිරියේදී නිවැරදි තොරතුරු මත පදනම්ව අවසන් ගිණුම් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | නිවැරදි හා නිශ්චිත තොරතුරු ගිණුම් මගින් ඉදිරිපත් කළ යුතුය. |

**(ආ) දේපල පිරියත හා උපකරණ**

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | 2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් තක්සේරු කළ යුතු වුවත් 2012 පෙබරවාරි 15 දින ආරක්ෂක අමාත්‍යාංශය වෙත පවරා තිබුණු ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය පිහිටි හෙක්ටයාර් 21.0437 ක ඉඩම් කොටස හා සුහුරුපාය ගොඩනැගිල්ල පිහිටි හෙක්ටයාර් 1.4164 ක ඉඩම් කොටස් තක්සේරු කිරීම ප්‍රමාදවීම හේතුවෙන් ගිණුම් ගත කර නොතිබුණි. | සුහුරුපාය ඉඩම හා ගොඩනැගිලි තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත 2022.07.28 දින ඉල්ලුම් කරන ලදී. ඒ අනුව පිඹුරුපත හා අනුමත ගොඩනැගිල්ලේ සැලැස්ම 2022.09.06 දින යොමුකර ඇත. මෙම තක්සේරු කිරීම ප්‍රමාද වී ඇත්තේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් කරන ලද ප්‍රමාදයන් නිසා බව දන්වමි. | 2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් තක්සේරු කර ගිණුම්කරණ අගය ලබාගතයුතු අතර 2022 දෙසැම්බර් 13 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2022/05 හි පොදු උපදෙස් 8. 2 අනුව තක්සේරු අගයට ගිණුම් ගත කළ යුතුය. |

**(ඇ) අග්‍රිම ශේෂය**

අග්‍රිම ශේෂය ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | මුදල් රෙගුලාසි 371 (2) (ආ) පටහැනිව සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා අවස්ථා 23 කදී විවිධ කාර්යයන් සඳහා ලබා දී තිබූ රු. 1,768,330 ක් වූ අත්තිකාරම් මුදල් පියවීමේදී දින 26 සිට මාස 05 දක්වා කාල පරාසයක ප්‍රමාදයක් නිරීක්ෂණය විය. | මෙවැනි ප්‍රමාදයන් අවම කිරීමට අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රමවේද අනුගමනය කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | අතුරු අග්‍රිමය දෙනු ලබන කාර්යය නිමකළ විගසම පියවීමට කටයුතු කළ යුතුවේ. |
| **(ii)** | අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශය අනුව භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම ප්‍රමාණය රු. 11,578,631,743 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ අග්‍රිම ලැබීම් ලෙස රු. 12,066,410,675 ක් දක්වා තිබුණු අතර ඒ අනුව අග්‍රිම ලැබීම් රු. 487,778,932 ක් වැඩියෙන් දැක්වුණි. තවද එම ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම වටිනාකම රු. 10,371,888 වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු. 498,150,820 ක් ලෙස රු. 487,778,932 ක් වැඩියෙන් දක්වා තිබුණි. ඒ අනුව නිවැරදි අගයන් පදනම්කර ගනිමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශයේ භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම ප්‍රමාණය රු.11,578,631,743 ක් ලෙස දක්වා ඇති අතර, එහි වෙනත් මූලාශ්‍ර වලින් ලද අග්‍රිම ලැබීම් ලෙස රු.498,150,820 ක වටිනාකමක් සටහන් කර ඇත. ඒ අනුව අග්‍රිම ලැබීම් මුළු එකතුව වන රු.12,076,782,563 මුළු අග්‍රිම ලැබීම් වටිනාකම ලෙස හඳුනා ගන්නා ලදි. | නිවැරදි අගයන් පදනම්කර ගනිමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුවේ. |

**(ඈ) ලේඛණ හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛණ විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | **තත්කාර්ය අතුරු අග්‍රිම ලේඛණය** | | |
| | ජාතික ශිෂ්‍යභට බලකාය විසින් 2022 ජුනි 23 දින දක්වා තත්කාර්ය අතුරු අග්‍රිම ලේඛණයක් පවත්වා නොතිබුණු බැවින් එදිනට පූර්වයෙන් සිදුකළ අතුරු අග්‍රිම ගෙවීම් හා පියවීම් පිළිබඳව අනාවරණය නොවුණි. | 2022 ජුනි 23 දින සිට ලබාදෙන සෑම තත්කාර්ය අතුරු අග්‍රිමයක්ම නියමිත ලෙස එම ලේඛණයේ සටහන් කර ගැනීමට අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රම මේ වන විට අනුගමනය කරන බව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි 372 ප්‍රකාරව අග්‍රිම හා අතුරු අග්‍රිම නිරතුරුවම පරීක්ෂාකළ හැකිවන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම ලේඛණයක් පවත්වාගත යුතුය. |

**(ii) හානි පිළිබඳ ලේඛණය**

| | | |
|---|---|---|
| මු.රෙ.110 ප්‍රකාරව අලාභහානි ලේඛණය පවත්වාගත යුතු වුවත් , 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා සිදුව ඇති අනතුරු අලාභහානි හා පාඩු සම්බන්ධයෙන් තොරතුරු ලේඛණගතව නොතිබුණු අවස්ථා 69ක් පැවතුණි. | පෙන්වා දී ඇති පරිදි මෙතෙක් එම වාර්තා ඉදිරිපත්කර නොමැති අනතුරු අලාභහානි හා පාඩු සම්බන්ධයෙන් තොරතුරු යාවත්කාලීන කර ලේඛණය නිසි පරිදි පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර හානි පිළිබඳ ලේඛණයක් පවත්වා ගැනීම හා තොරතුරු යාවත්කාලීන කිරීම සිදුකළයුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මු.රෙ.128(2)(ඇ) ප්‍රකාරව ආදායම් ශීර්ෂය 10.03.07.05 (බලපත්‍ර ගාස්තු ආදායම) සඳහා 2022 ආදායම් ඇස්තමේන්තු සහ සංශෝධිත ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී ඒ ඒ දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් රැස්කිරීමට යෝජිත ආදායම පිළිබඳ ඇස්තමේන්තු කැඳවා නොතිබුණි. | ඉදිරියේදී එම ආයතනවලින් ඇස්තමේන්තු කැඳවා වාර්ෂික ඇස්තමේන්තුව සකස් කිරිමට කටයුතු කිරීමට පියවර යොදා ඇත. | මු.රෙ. ප්‍රකාරව රාජ්‍ය ආදායම වෙනත් දෙපාර්තමේන්තු හා කාර්යාල මගින් එකතු කරනු ලැබේ නම් ඒ දෙපාර්තමේන්තුවලින් සහ කාර්යාලවලින් වාර්තා ලබාගෙන ඒවායේ සඳහන් කරුණු රාජ්‍ය ඇස්තමේන්තුවලට අන්තර්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

### 2.2 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 50 (ii) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත්, නිවැරදිවත් පිළියෙල කලයුතු වුවත් වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් වැය විෂයයන් හතකට සලසා තිබුණු රු. 85,063,000 ක ප්‍රතිපාදන මෙන් පස්ගුණයකට ආසන්න රු. 409,510,000 ක අතිරේක ප්‍රතිපාදන, පරිපූරක ඇස්තමේන්තු හා මු.රෙ. 66 මාරු කිරීම් යටතේ ලබාගෙන තිබීම හේතුවෙන් වාර්ෂික ඇස්තමේන්තු සම්පූර්ණවත්, නිවැරදිවත් පිළියෙල කර නොමැති බව නිරීක්ෂණය විය. | 2022 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණය නොලැබුණු අතර, සංශෝධිත අයවැය මගින් ලබාදුන් ප්‍රතිපාදන ප්‍රමාණය සීමාකර තිබුණි. එබැවින් වැය විෂයන් වෙනුවෙන් 2022 වර්ෂය සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් පරිපූරක ඇස්තමේන්තු හා මු.රෙ. 66 මාරු කිරීම් යටතේ අතිරේක ප්‍රතිපාදන ලබා ගැනීමට සිදු විය. තවද, 2022 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව 2021 වර්ෂයේ ජුනි මාසය තුල පැවති වෙළෙඳපල මිල ගණන් අනුව පිලියෙලකර ඇතත් උද්ධමනය හේතුවෙන් සෑම කේෂ්ත්‍රයකම මිල ඉහල යාම් නිසා ඇස්තමේන්තුගත | මුදල් රෙගුලාසි 50 (ii) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත්, නිවැරදිවත් පිළියෙල කලයුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන්ද අතිරේක ප්‍රතිපාදන ලබා ගැනීමට සිදුවිය. | |
| (ආ) | 103-01-01 වන ව්‍යාපෘතිය- අමාත්‍ය කාර්යාලයේ පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් 21 ක් වෙනුවෙන් රු. 18,015,000 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණු අතර අමාත්‍ය කාර්යාලය සඳහා කාර්ය මණ්ඩලයක් පත්කර නොමැතිවීම හේතුවෙන් පුනරාවර්තන හා මූලධන වියදම් වෙනුවෙන් සලසා තිබුණු ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරිවී ඇති බව ගිණුම් මගින් දක්වා තිබුණි. එහෙත් එම ප්‍රතිපාදනයෙන් සියයට 93 හෙවත් රු. 16,805,000 ක්, මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයන් 17කට මාරු කර වැයකර ඇති බව නිරීක්ෂණය විය. එහෙත් මුදල් රෙගුලාසි 66 යටතේ මාරුකිරීමෙන් අනතුරුව තවදුරටත් ඉතිරිව පැවති රු.1,210,000 ක ප්‍රතිපාදනය පමණක් සියයට 100 ක් ඉතිරියක් ලෙස වියදම් ප්‍රකාශය මගින් දක්වා තිබුණි. | 103-01-01 වන ව්‍යාපෘතිය ආරක්ෂක අමාත්‍යවරයාගේ වියදම් වෙනුවෙන් වෙන් කර ඇති අතර, අමාත්‍යාංශයේ අමාත්‍යවරයා ලෙස කටයුතු කරන්නේ ජනාධිපතිවරයා වේ. අමාත්‍යවරයා වෙනුවෙන් සියලු වියදම් ජනාධිපති ලේකම් කාර්යාලීය වියදමින් දරනු ලබන බැවින් 103-01-01 ව්‍යාපෘතියේ ප්‍රතිපාදන වර්ෂය අවසානයේ ඉතිරි විය. | මුදල් රෙගුලාසි 04 ප්‍රකාරව වියදම් වැඩසටහන්ගත කිරීමේදී, අනුමත කරනු ලබන අරමුදල් මුදල් වර්ෂය තුල සාක්ෂාත් කරගත හැකි වැඩසටහන් වලට සීමා කරන බවට සහතික වියයුතු අතර අවශ්‍යතාව නිසිලෙස හඳුනාගෙන ඇස්තමේන්තු සකස් කිරීමත්, ප්‍රතිපාදන මාරු කිරීමේදී නිසි කළමනාකරණයක් පවත්වා ගැනීමත් සිදුකල යුතුය. |
| (ඇ) | වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන සලසා නොතිබුණු 103-2-17-7-2509-0-13 වැය විෂය සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් රු. 15,000,000 ක ප්‍රතිපාදන සලසාගෙන ඇතත් එම ප්‍රතිපාදනයෙන් රු. 10,371,888 ක් හෙවත් සියයට 69 ක් ඉතිරිව පැවතුණි. | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 103-02-17-7-2509-0-13 යන වැය විෂය සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් රු.15,000,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. මෙය UNDP විසින් අරමුදල් සපයන නව ව්‍යාපෘතියක් වන අතර, නියාමන රාමුවේ අනුමැතිය සහ මූලික කටයුතු සඳහා මාස දෙකකට වැඩි කාලයක් ගත විය. අක් මුදල් ඔක්තෝබර් මාසයේ ලැබූ බැවින් ක්‍රියාකාරී සැලැස්මට අනුව 2022 දී තෝරාගත් වැඩසටහන් පමණක් පැවැත්වූ අතර, ඉතිරි වැඩසටහන් 2023 වර්ෂයේදී පවත්වනු ලබන බැවින් ඒ සඳහා වන ප්‍රතිපාදන ඉතිරිය රු.10,371,888 ක් ලෙස දැක්වේ. | අවශ්‍යතාව නිසිලෙස හඳුනාගෙන ඇස්තමේන්තු සකස් කලයුතුය. |
| (ඈ) | 103-2-19-6-2509-0-17 දරන මූලධන වැය විෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තු මගින් රු. 78,080,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර , පරිපූරක ප්‍රතිපාදන මගින් රු. 260,000,000 ක්ද, මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් මගින් රු. 125,000,000 ක්ද ලබාගෙන තිබුණි. එහෙත් සලසා තිබුණු රු. 463,080,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් දරා ඇති තථ්‍ය වියදම රු. 261,500,000 ක් වූයෙන් සලසා තිබුණු ශුද්ධ | 03/2022 වියදම් පාලන චක්‍රලේඛය මගින් රාජ්‍ය වියදම් සීමා කිරීම නිසා ප්‍රමාණවත් අක් මුදල් මහා භාණ්ඩාගාරය වෙතින් නොලැබීම මත මෙලෙස ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව දැක්විය හැකිය. | අවශ්‍යතාව නිසිලෙස හඳුනාගෙන ඇස්තමේන්තු සකස් කලයුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රතිපාදනයෙන් සියයට 43 ක් හෙවත් රු. 201,580,000 ක ඉතිරිවීම් පැවතුණි. | | |
| **(ඉ)** | රු .141,100,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් 4 කට අදාලව සමාලෝචිත වර්ෂය තුල දරා තිබුණු මුළු වියදම රු. 136,096,605 ක් වුවද, අත්‍යවශ්‍ය බව හා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බව යනාදී කරුණු දක්වමින් මුදල් රෙගුලාසි 66 යටතේ රු. 46,500,000 ක් අතිරේක ප්‍රතිපාදන මාරු කරගෙන ඇතත් එසේ මාරු කරගත් අතිරේක ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරිව පැවති අතර මුල් ප්‍රතිපාදනයෙන්ද රු. 5,003,395 ක් ඉතිරිව පැවතිණි. | අතිරේක ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරිව පැවතීම සඳහා අක් මුදල් ප්‍රමාණවත් නොවීම, 03/2022 අයවැය චක්‍රලේඛ ප්‍රකාරව අත්‍යවශ්‍ය වියදම් පමණක් දැරීම සහ මූලධන වත්කම් වැඩිදියුණු කිරීම් සීමා කිරීම ආදිය හේතුවිය. | අවශ්‍යතාව නිසිලෙස හඳුනාගෙන ඇස්තමේන්තු සකස් කලයුතු අතර ප්‍රතිපාදන මාරු කිරීමේදී නිසි කළමනාකරණයකින් යුතුව සිදුකල යුතුය. |
| **(ඊ)** | 2021 දෙසැම්බර් 21 දිනැති අයවැය චක්‍රලේඛ අංක 03/2021 හා 2022 අප්‍රේල් 26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 මගින් රාජ්‍ය වියදම් පාලනය කිරීම සඳහා උපදෙස් ලබා දී තිබුණද මුදල් වැය කිරීමේ දී අනාර්ථිකව හා අරපිරිමැසුම් රහිතව කටයුතු කළ අවස්ථා පැවති බව නියැදි පරීක්ෂාවලදී නිරීක්ෂණය විය. | | |
| **(i)** | ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලය විසින් 2022 ජනවාරි 13 දින පවත්වා තිබූ එක් දින සම්මන්ත්‍රණයකට සහභාගි වූ ත්‍රිවිධ හමුදා නිලධාරීන් 300 ක් ඇතුළු 400ක් වෙනුවෙන් දේශන ශාලාගාස්තු, වෙනුවෙන් රු. 1,924,000ක් ද, සංග්‍රහ වියදම් වෙනුවෙන් රු.2,327,906 ක් ද, අනෙකුත් වියදම් වෙනුවෙන් රු.945,507ක් ද වශයෙන් රු. 5,197,413 ක් වැයකර තිබීම. | පාඨමාලාව පැවැත්වූ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ නිල ආහාර සැපයුම්කරු ගෙන් ආහාරපාන ලබාගැනීම, ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහභාගීවූ බැවින් ත්‍රිවිධ හමුදා ආහාර හා සංග්‍රහ ක්‍රමවේද අනුගමනය කළ යුතුවීම, ආරක්ෂාව තහවුරු කිරීම, අත්‍යවශ්‍ය පෙරපුහුණු පැවැත්වීම හා සිත්ගන්නාසුළු පරිදි සැරසිලි කිරීම ආදිය හේතුවෙන් මෙම වියදම් දැරීමට සිදුවිය. | චක්‍රලේඛ උපදෙස් අනුව රාජ්‍ය වියදම් පාලනයට කටයුතු කළයුතු අතර වියදම් දැරීමේදී ආර්ථිකව, කාර්යක්ෂමව හා ඵලදායී ලෙස කටයුතු කිරීමෙන් රජයට අවම පිරිවැයක් හා ප්‍රශස්ථ නිමවුමක් ලැබෙන අයුරින් කටයුතු කළ යුතුවේ. |
| **(ii)** | ජාතික ආරක්ෂක විද්‍යායතනය විසින් පවත්වනු ලබන පාඨමාලාවේ දේශකවරු සඳහා පැයකට රු.3,000 ක් බැගින් රු.2,322,261 ක දේශක දීමනා ගෙවා තිබියදී ප්‍රවාහන පහසුකම් වෙනුවෙන් රු.295,920 ක මාසිකව කුලී පදනම මත වාහන දෙකක් සැපයීම වෙනුවෙන් 2022 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාලය තුල රු. 2,756,383 ක් සහ එම වාහන සඳහා ඉන්ධන වියදම්ද දරා තිබීම. | මෙම විද්‍යායතනයේ සිට කි.මී. 15 ක පමණ සීමාවක් තුල පිහිටි විශ්ව විද්‍යාල වෙතින් දේශකවරුන් රැගෙන ඒම සිදු කරනු ලබන අතර නියමිත වේලාවට ආරාධිත දේශකයින් ගෙන්වා ගැනීමට හැකිවීම සහ නැවත ප්‍රවාහනය කරලීම තුලින් පාඨමාලාව සැලසුම්කළ පරිදි බාධාවකින් තොරව සාර්ථක කර ගැනීමට හැකිවිය. | -එම- |

| | | | |
|---|---|---|---|
| **(ii)** | ජාතික ආරක්ෂක විද්‍යායතනය විසින් පවත්වනු ලැබූ පළමු පාඨමාලාව සඳහා සහභාගි වූ විද්‍යාර්ථීන් 31 ක් සඳහා නවාතැන් පහසුකම් ලබාදීම වෙනුවෙන් 2021 නොවැම්බර් 01 දින සිට ඉදිරි වර්ෂ 2 ක කාලයක් සඳහා රු.72,000,000 ක බදුකුලී ගිවිසුමක් මත ගෘහ ඒකක 24 කින් යුත් නිවාස සංකීර්ණයක් ලබාගෙන මාසිකව රු. 3,000,000 බැගින් කුලී ගෙවා තිබීම හා එම නිවාස සංකීර්ණයේ සිට ප්‍රවාහන පහසුකම් සැපයීම වෙනුවෙන් 2022 ජනවාරි 01 දින සිට වසරක කාලයක් සඳහා මාසිකව රු.199,500 ක කුලී පදනම මත බස් රථයක්ද ලබාගෙන තිබීම. | පාඨමාලාවට සහභාගී වූ බැහැර ප්‍රදේශයන්හි විද්‍යාර්ථයින් සඳහා විද්‍යායතනයට ආසන්නව නවාතැන් හා ප්‍රවාහන පහසුකම් ලබාදුන් අතර, එමගින් විද්‍යාර්ථයින්ගේ අධ්‍යයන කටයුතු නියමිත වේලාවට, ක්‍රමවත්ව, මනා සහ සම්බන්ධතාවයෙන් යුතුව, හා උසස් මානසික මට්ටමකින් යුතුව සිදුකර ගැනීමට හැකිවී ඇත. | -එම- |
| **(iii)** | එක් පාඨමාලාවක් අවසානයේදී ඊළඟ පාඨමාලාව කඩිනමින් ආරම්භ කිරීමට හැකිවන පරිදි පාඨමාලා සංවිධානය කර නොතිබීම හේතුවෙන් මාස 03කට ආසන්න කාලයක් නිශ්කාර්යව පැවති නිවාස සංකීර්ණයේ බදුකුලී වෙනුවෙන් රු. 10,500,000ක අනාර්ථික වියදමක් දරා තිබීම. | පාඨමාලාව අවසන් කිරීමෙන් පසුවද, ඔවුන්ගේ වැඩිදුර උපාධි අධ්‍යයන කටයුතු සාර්ථකව සිදුකර ගන්නා තෙක් ඔවුන්හට නවාතැන් පහසුකම් ලබාදීම සිදුකරන ලදී.<br><br>2023/02 පාඨමාලාවට සහභාගීවන විද්‍යාර්ථීන්ගේ පෙර වැඩමුළුව (Pre-Course) සඳහා මෙම නිවාස සංකීර්ණයේ දින 14 ක නවාතැන් පහසුකම් ලබාදී ඇත. | -එම- |

**2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනයේ දැක්වෙන සටහන් අංක (iii) හා (iv) අනුව 2022 දෙසැම්බර් 31 දිනට පැවති බැඳීම් හා බැරකම්වල එකතු වටිනාකම රු. 449,815,619 ක් වූ අතර, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව දැක්වෙන බැඳීම් හා බැරකම් ප්‍රමාණය රු. 452,564,354 ක් විය. ඒ අනුව රු. 2,748,735 ක වෙනසක් නිරීක්ෂණය විය. | එම වරද ඉදිරියේදී සිදු නොවීමට වගබලා ගන්නා බව දන්වමි. | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් සමග සැසඳීම් කර නිවැරදි අගයන් දැක්විය යුතුය. |
| (ආ) | 2023 වර්ෂයේ ගෙවීම් වවුචර් පිළිබඳ නියැදි පරීක්ෂණයේදී 2022 වර්ෂයට අදාළව අවස්ථා 4 කදී එකතුව රු. 28,642,188 ක් වූ වියදම් 2023 වර්ෂයේ ප්‍රතිපාදන වලින් වැය කර තිබුණු නමුත් එම වියදම් 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල බැරකම් ලෙස හඳුනාගෙන නොතිබුණි. ඒ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල රු. 28,642,188ක බැරකම් අඩුවෙන් දක්වා තිබුණි. | දෙසැම්බර් මාසය අවසාන වීමෙන් පසුව දුශ්කර දීමනා හා සංයුක්ත දීමනාව ගෙවීම් කරන බැවින් සහ ප්‍රතිපාදන ප්‍රමාණවත්ව නොතිබීම යන කරුණු හේතුවෙන් මෙම වාර්තාවට ඇතුලත්ව නැත. | වර්ෂයට අදාල බැඳීම් හා බැරකම් නිසි ලෙස හදුනාගෙන මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුය. |

**2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| (අ) | 2015 ඔක්තෝබර් 09 දිනැති අංක PED/RED/2015/ 8/පොදු(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 01. | 1,336,746 | ස්ථාන මාරුවී ගොස් ඇති , විශ්‍රාමික, මියගිය, වැඩ තහනම් කර ඇති සහ සේවය අතහැර ගොස් ඇති නිලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂය රු. 4,244,535ක් වූ අතර එම ණය ශේෂය තුල වසර 05ට වැඩි කාලයක් හිඟහිටි ණය ශේෂය රු. 1,336,746ක් විය. මෙම කල්ගතවූ ණය ශේෂ සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම ණය ශේෂ නිරවුල් කරගැනීමට අදාල කටයුතු අඛණ්ඩව සිදුකරමින් පවතී. | චක්‍රලේඛවලට අනුව ක්‍රියාකල යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 128 (I) (ඉ) | - | රජය සතු වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදනු ලබන බව හා වරින් වර සත්‍යාක්ෂණය කරනු ලබන බවට ප්‍රමාණවත් විධිවිධාන යෙදිය යුතු වුවද ආපදා කළමනාකරන අංශය සතු වාහන 25ක් පිළිබඳව වාර්ෂික සමීක්ෂණ සිදු කර නොතිබුණි. | 2022.12.31 දින වන විට ආපදා කළමනාකරණ අංශයේ වාහන සමීක්ෂණයක් සිදුකර නොමැති බැවින්, වාහන ස්ථාවර වත්කම් ලේඛණයට ඇතුලත් කොට යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ සභාපතිත්වයෙන් යුතු කමිටුවක් පත්කර වාහන සමීක්ෂණයක් ඉදිරියේදී සිදු කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | රෙගුලාසි ප්‍රකාරව වාර්ෂික සමීක්ෂණ සිදුකර වත්කම් වල සුරක්ෂිතභාවය තහවුරු කළ යුතුවේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | මු.රෙ.128(2)(එ) සහ 2015 ජුලි 20 දිනැති රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015 සහ 1/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය - | රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව අයකරනු ලබන ගාස්තු කාලානුරූපිව සංශෝධනය කළ යුතු වුවත් **1996** අංක **22** දරන තුවක්කු (සංශෝධන) පනත යටතේ අයකරනු ලබන ගාස්තු කාලීනව සංශෝධනය කිරීම තවදුරටත් ප්‍රමාද වෙමින් පැවතුණි. | නව ගිනිඅවි ආඥාපනත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් 2023.02.08 දින මෙම අමාත්‍යාංශය වෙත යොමු කරන ලද අතර**,** ගිනිඅවි ආඥාපනතෙහි අවසන් සංශෝධිත වාර්තාව ලබාදීමට නියමිතව පවතී. | චක්‍රලේඛ ප්‍රකාරව අයකරනු ලබන ගාස්තු සමාලෝචනය කර සංශෝධනය කළ යුතුය. |

**2.5** **බැංකු ගිණුම් මෙහෙයවීම**

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වු අඩුපාඩු පහත දැක්වේ**.**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල බැංකු ගිණුම් වෙත ඍජු තැන්පතු ලෙස ලැබී තිබුණු රු.1,233,439ක් වූ හඳුනානොගත් තැන්පතු පැවති අතර ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ගිණුම් ගැලපී නොතිබුණු බව නිරීක්‍ෂණය විය. | 2023 මාර්තු මාසය අවසානයට රු. 531,199 ක තැන්පතු හැර ඉතිරිය හඳුනාගෙන ඇත.<br>එම මුදල බැංකු ලදුපත් ලැබෙන ආකාරයට ඉදිරියේදී හඳුනාගෙන ගිණුම්ගත කිරීමට පියවර ගන්නා බවද දන්වමි. | හඳුනා නොගත් ලැබීම් හඳුනාගැනීමට හා ගිණුම් ගැලපීමට කටයුතුකල යුතුය. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **ආරක්ෂක මූලස්ථානය සංකීර්ණය ඉදිකිරීම් ව්‍යාපෘතිය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආරක්ෂක හමුදා මූලස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘතියේ ඇතැම් ඉදිකිරීම් ප්‍රමාදවීම, ණයවර ලිපි විවෘත කිරීම ප්‍රමාදවීම ආදිය හේතුවෙන් අපේක්ෂිත කාලය තුල කොන්ත්‍රාත් නිමකිරීමට නොහැකිවීම මත කොන්ත්‍රාත් කාලසීමාව දීර්ගකිරීමට සිදුව තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වනවිට එවැනි සැපයුම් කොන්ත්‍රාත්කරුවන් 06 දෙනෙකු විසින් රු.1,389,272,688 ක් හා එක්සත් ජනපද ඩොලර් 6,212,417 ක් වූ කාලය දීර්ඝ කිරීමේ හිමිකම් පෑම් (Claims for EOT) 28 ක් ඉල්ලුම් කර තිබුණු බැවින් අසම්භාව්‍ය බැරකමක් පැවතුණි. | ප්‍රතිපාදන ලැබීම ප්‍රමාද වීම, කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවීම් සිදු කිරීමට අවැසි ද්‍රවශීලි මුදල් නොමැති වීම, ණයවර ලිපි සඳහා භාණ්ඩාගාර අනුමැතියන් ප්‍රමාද වී ලැබීම, ආදිය හේතුවෙන් අදාළ කාලසීමාවේදී කොන්ත්‍රාත් අවසන් කිරීමට නොහැකි වීමෙන් කොන්ත්‍රාත් කොන්දේසි ප්‍රකාරව කාලය දිර්ඝ කිරිමේ හිමිකම් පෑම් (**EOT Claims)** ඉල්ලුම් කර ඇත.<br>මෙම හිමිකම් පෑම් නැවත සමාලෝචනය කර සත්‍ය වියදම් ගණනය කිරීම සඳහා ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශණ කාර්යාංශය (**CECB)** වෙත යොමුකර ඇති අතර**,** අමාත්‍යාංශය විසින් (**Dispute Adjudication Board)** ආරවුල් විනිශ්චය මණ්ඩලයක් ද පත් කර ඇත. ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත ආයතන දෙකක් වෙත 2019 සහ 2017 වර්ෂයන්හි රු. 8,640,503.46 ගෙවීම් සිදු කර ඇත. | අනවශ්‍ය ප්‍රමාදයන් හේතුවෙන් ඇතිවන අතිරේක හිමිකම්පෑම් අවමකර ගැනීමෙන් අනාර්ථික වියදම් අවමකරගත යුතුය. |

**3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උපාය මාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතියේ මූලික සැලසුම් අනුව 2016 වර්ෂය අවසන් වනවිට ව්‍යාපෘතියේ ඉදිකිරීම් අවසන් කිරීමට යෝජිතව පැවතියද විවිධ ප්‍රමාදයන් හේතුවෙන් සැලසුම්ගත කාලසීමාවන් තුළ අපේක්ෂිත කාර්යසාධන මට්ටම් කරා ලඟාවී නොතිබුණි. ව්‍යාපෘති කාලසීමාව වර්ෂ 06 කින් දීර්ඝකර ඇතත් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට පැවති සමස්ථ භෞතික ප්‍රගතිය සියයට 71.5 ක් බව වාර්තාගතවිය. මෙම ව්‍යාපෘතිය අවසන් නොවීම හේතුවෙන් ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත සන්නද්ධ සේවා අතර ඒකාබද්ධ උපාය මාර්ගික සංනිවේදනය පවත්වාගැනීමේ මූලික අරමුණ ඉටුකර ගැනීම තවදුරටත් ප්‍රමාදවෙමින් පැවතුණි.<br>මෙම ව්‍යාපෘතිය සඳහා ක්ෂුද්‍ර තරංග ගුවන් විදුලි සන්නිවේදන පද්ධතියක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කාර්යය 2016 වර්ෂයේ ආරම්භකර තිබුණු නමුදු විවිධ කරුණු හේතුවෙන් ලංසු අවලංගු කර තිබුණ අතර 2021 ජනවාරි 11 දින ප්‍රසම්පාදන කාර්යයන් නැවත අරඹා ඇතත්, ප්‍රසම්පාදන කමිටු නිර්දේශ ලබාදීම 2022 අප්‍රේල් 20 දක්වා ප්‍රමාද වී තිබුණි. පසුව ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් ප්‍රසම්පාදන කාර්ය තාවකාලිකව අත්හිටුවා තිබුණි. මේ අනුව මෙම ප්‍රසම්පාදන කාර්යය සඳහා වර්ෂ 06 කට ආසන්න කාලයක් ගතවීම ව්‍යාපෘතිය ප්‍රමාද වීම කෙරෙහි සෘජුවම බලපා තිබුණි. | ක්ෂුද්‍ර තරංග ගුවන් විදුලි සන්නිවේදන පද්ධතියක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කාර්යය 2016 වර්ෂයේ ආරම්භකර අවස්ථා කිහිපයකදී කැඳවනු ලැබුව ද ලංසු ලේඛන සංශෝධනවල වෙනස්කම් හේතුවෙන් හා ලංසු කරුවන් විසින් ලංසු කොන්දේසි සපුරා නොතිබීම හේතුවෙන් නියමිත කලට සිදු කිරීමට නොහැකි වීම,<br>නවීන තාක්ෂණයට ගැලපෙන පරිදි පිරිවිතර සංශෝධනය කල යුතු වීම ආදිය හේතුවෙන් ලංසු අවලංගු කර තිබූ අතර, 2021 ජනවාරි 11 වන දින නැවත ආරම්භ කල ලංසු ඇගයීම් ප්‍රමාදය හා ප්‍රසම්පාදන අභියාචනා ක්‍රියාවලියට යොමුවීම හේතුවෙන් කමිටු නිර්දේශ ලබාදීම 2022 අප්‍රේල් 20 දක්වා ප්‍රමාද වීම.<br>2022 වර්ෂයේ එවකට පැවති මූල්‍යමය තත්ත්වය හේතුකොට ගෙන ප්‍රතිපාදන අවුරා තිබීම හා වියදම් සීමා කිරීම හේතුවෙන් ප්‍රසම්පාදන කාර්යය මේ දක්වා නැවැත්වීම.<br>ඉහත කාර්යයන් හේතුවෙන් ප්‍රසම්පාදන කාර්යයන් සඳහා වර්ෂ 06 ආසන්න කාලයක් ගත වී තිබුනු අතර, එය ව්‍යාපෘතිය ප්‍රමාද වීම සඳහා සෘජුවම බලපා ඇත. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘතිය අවසන් කර අපේක්ෂිත කාර්යසාධන මට්ටමට ලඟාවීමට කටයුතු කල යුතුය. |
| (ආ) | 2016 ඔක්තෝබර් 18 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයක් පරිදි ජාතික ආරක්ෂක විද්‍යායතනය 2021 මැයි මස ස්ථාපිත කර, එහි ප්‍රථම පාඨමාලාවේ සහතික පත් ප්‍රදානය 2022 සැප්තැම්බර් 14 දින සිදුකර ඇතත් ආයතනය පිහිටුවීමට අදාල පනත් කෙටුම්පත් සම්මතකර නොතිබීමෙන් ආයතනයට අදාල නීතිමය ප්‍රතිපාදන සැලසී නොතිබුණි. | මෙම විද්‍යාතනය පිහිටු වීමට අදාළ පනත මේ වන විට කෙටුම්පත් අවධියේ පවතින අතර, 2022 ජනවාරි මස 12 වන පැවති ජාතික ආරක්ෂක විද්‍යාතන 6 වන කළමනාකරණ රැස්වීමේ තීරණයට අනුව මෙම විද්‍යාතනයේ කටයුතු පවත්වාගෙන යනු ලබයි. | අදාල පනත් සම්මතකර ගැනීමෙන් ආයතනයේ නීත්‍යානුකූලභාවය තහවුරුකර ගතයුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2016 මාර්තු 30 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයක් පරිදි ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය 2016 ජූලි මස පිහිටුවා තිබුණි. එහෙත් මෙම ආයතනය නීත්‍යානුකූල පදනමින් ස්ථාපනය කිරීම වර්ෂ 6 කට වැඩි කාලයක් ප්‍රමාද වෙමින් පැවතුණි. | සංශෝධිත පනත් කෙටුම්පත 2023.03.30 වන දින නීතිපති දෙපාර්තමේන්තුව වෙත යවන ලද අතර, 2023.05.09 දිනැති ලිපිය මඟින් නීතිපති විසින් එකී පනත් කෙටුම්පතෙහි ඉදිරි කටයුතු සිදුකර අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරන බව ලිඛිතව දැනුම් දී ඇත.<br><br>පනත සම්මත කිරීමට ප්‍රමාද වුවද, අපේක්ෂිත අරමුණු හා ආයතනික පරමාර්ථ ඉටුකිරීම සහ ඉදිරි කටයුතු සැලසුම් කිරීම ආර්ථාන්විතව හා කාලීනව ඉටු කර ඇත. | අදාල පනත් සම්මතකර ගැනීමෙන් ආයතනයේ නීත්‍යානුකූලභාවය තහවුරුකර ගතයුතුවේ. |

**3.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උපාය මාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතිය සඳහා 2016 සහ 2017 වර්ෂවලදී රු.මිලියන 38.54 ක් වැයකර මිලදීගෙන තිබුණු විදුලි ජනක යන්ත්‍ර 22 ක් හා රු.මිලියන 562.16 ක් වැයකර ඉදිකිරීම් නිමකර තිබුණු සන්නිවේදන කුළුණු 11 සහ එයට සම්බන්ධිත උපාංග මැදිරි සමගාමී ක්‍රියාවන්ගේ දීර්ග ප්‍රමාදය හේතුවෙන් 2020 වර්ෂයේ සිට අපේක්ෂිත අරමුණට යොදාගැනීමට නොහැකිව තිබුණි. | ශබ්ද වාරක විදුලි උත්පාදක යන්ත්‍ර 22 ස්ථාන ගත කොට ඇති අතර, කුටි ඉදිකිරීම ද 2020.12.31 වන දිනට නිම කොට ඇත. මෙම යන්ත්‍ර අපේක්ෂිත අරමුණු කරා යොදා ගැනීමට නොහැකි වුවද මේ වන විට ත්‍රිවිධ හමුදාව සහ විශේෂ කාර්ය බලකායේ ගුවන්විදුලි ප්‍රති විකාශන අවශ්‍යතාවන් සඳහා භාවිතා කරනු ලබයි. | උපාය මාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘති අරමුණු වෙනුවෙන් කාලීනව උපයෝජනයට කටයුතු කළ යුතුය. |
| (ආ) | ආපදා කළමනාකරණ අංශය විසින් 2020, 2021 හා 2022 යන වර්ෂවල සිදු වූ සුළි සුළං ඇතුලු ස්වාභාවික ආපදා හේතුවෙන් ගලෙන්බිඳුණුවැව, තලාව හා තඹුත්තේගම යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වල නිවාස හා දේපළ හානියට පත් පුද්ගලයන් 38 දෙනෙකු වෙත එකතුව රු.1,315,519 ක වන්දි මුදලක් ගෙවීමට තක්සේරු කර තිබුණද එක් නිවසකට රු. 10,000 බැගින් රු.300,000 ක අත්තිකාරම් මුදලක් ගෙවීම හැරුණු විට ඉතිරි රු. 1,015,519 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගෙවා නොතිබුණු බව නියැදි පරීක්ෂාවකදී අනාවරණය විය. තවද මෙලෙස 2022 වර්ෂයේ ආපදාවට පත් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | ආපදා කළමණාකරණ චක්‍රලේඛ 1/2020 ප්‍රකාරව හානියට පත් දේපළ සඳහා වන්දි ලබාදීමට 2022 වර්ෂයේ හතර වන කාර්තුව සඳහා මහා භාණ්ඩාගාරය විසින් ලබා දී තිබූ ප්‍රතිපාදන 2022 නොවැම්බර් මස වන විට අවසන් වීම හේතුවෙන් එම වර්ෂය සඳහා ඉතිරි වන්දි මුදල් සඳහා ප්‍රතිපාදන ලබාදීමට නොහැකි වුවත් මේ වන විට එම ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත යොමුකර ඇත.<br>දේපළ අයිතිය තහවුරු කිරීමට අපොහොසත් වූ ප්‍රතිලාභීන් සඳහා වන්දි ලබාදීම සිදු නොකළ අතර, ලියවිලි නිවැරදි කර යොමු කරන මෙන් දන්වා යවන ලදී. | ආපදා කළමණාකරණ චක්‍රලේඛ 1/2020 ප්‍රකාරව නිවාස හා දේපළ හානි වන්දි ගෙවීම් සිදුකල යුතුවේ. |

19 ක පුද්ගලයන් 231 ක් සඳහා 2022 දෙසැම්බර් 31 වන විටත් වන්දි මුදල් ගෙවා නොතිබුණි.

**3.4 ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) i | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 සඳහා වන අතිරේකය 35 අනුව ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවකට රු. මිලියන 200 ක් දක්වා වන ප්‍රසම්පාදනයන් සඳහා අනුමැතිය ලබාදිය හැකිවුවත් ආරක්ෂක මූලස්ථාන ඉදිකිරීම් ව්‍යාපෘතියේ ගොඩනැගිලි 1, 2, සහ 4 සඳහා සෝෆා කට්ටල 390 ක් සහ මේස (Coffee Table) 110 ක් එකවර මිලදී ගැනීමට හැකියාව තිබියදී සමාන කාලපරිච්ඡේයක් තුළ අවස්ථා 3 ක් යටතේ ලංසුකැඳවා එකම සැපයුම්කරුවෙකුගෙන් මිලදී ගැනීම හේතුවෙන් රු. 3,855,140 ක මිල විචලන අවාසියක් තිබුණු බව නිරීක්ෂණය විය. | පහත සඳහන් හේතුන් මත සෝෆා කට්ටල හා මේස (Coffee Table) සඳහා වෙන් වෙන් වශයෙන් ලංසු කැඳවා කොන්ත්‍රාත් පිරිනැමීමට සිදුවූ බැවින් විගණන වාර්තාවේ දක්වා ඇති අමතර වියදම දැරීමට සිදුව ඇති බව දන්වා සිටිමි.<br><br>• පරිපාලන කටයුතුවල පහසුව සඳහා එක් එක් ගොඩනැගිලි වල කොන්ත්‍රාත් කටයුතු / සැපයීම් සේවා වෙන් වෙන් වශයෙන් සිදුකිරිමට ආරම්භයේදී තීරණය කරන ලදී.<br>• එක් එක් ගොඩනැගිලි සඳහා එකම සේවාව සිදුකරන ලද වුවත් එහි අවසාන වගවීම ඒ ඒ හමුදාවන් හා ආරක්ෂක අමාත්‍යාංශය මඟින් සිදුවන බැවින් මිල ගණන් කැඳවීමේ සිටම වෙන් වෙන් වශයෙන් ලිපි ගොණු පවත්වා ගැනීමට කටයුතු කරන ලදී.<br>• ප්‍රසම්පාදන තුන එකවිට සිදුකරන ලද්දේ නම් සෝපා කට්ටල 387 හා මේස 110 ක් වැනි ප්‍රමාණයක් එම කාලසීමාව තුලදී සැපයීම් සිදුකිරිමට කොන්ත්‍රාත් සමාගම් ඉදිරිපත්වේ ද යන අවිනිශ්චිතභාවය සහ කුඩා පරිමාණ සැපයුම්කරුවන්ට ද අවස්ථාව ලබාදී වැඩි තරඟකාරීත්වයක් ඇති කිරිම.<br>• ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6.1 ට අනුව උනන්දුවක් දක්වන සැමටම සාධාරණ හා සමාන අවස්ථා ලබාදීම. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කර අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව උපරිමකරණය සඳහා කටයුතු කළ යුතුය. |
| ii. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 ඡේදය අනුව ලංසුකරුවකු ඉදිරිපත් කරන ලද ලංසුව කිරීමෙන් පසු ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් අදාල ලංසුකරු වෙත වහාම විධිමත් ප්‍රතිග්‍රහන ලිපියක් නිකුත් කල යුතු වුවත්, අමාත්‍යාංශය විසින් සෝෆා කට්ටල සැපයීමට තෝරාගත් සැපයුම්කරු වෙත ඇණවුම් ප්‍රදානය කිරීමට දින 33 සිට දින 52 දක්වා ප්‍රමාද වී තිබුණි. | ඉදිරියට මෙම ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, ප්‍රසම්පාදන අංශය හා CECB ආයතනය වෙතින් අදාළ කටයුතු කාර්යක්ෂමව සිදුකිරිමට අවශ්‍ය උපදෙස් ලබා දෙමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 ඡේදය අනුව ලංසුව ප්‍රතිග්‍රහනය කිරීමෙන් පසු අදාල ලංසුකරු වෙත වහාම විධිමත් ප්‍රතිග්‍රහන ලිපියක් නිකුත් කල යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) i | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.1 (අ) වගන්තියේ නියමයන්ට පටහැනිව, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සඳහා පොලියස්ටර් වූල් රෙදි මීටර් 529,000 ක් මිලදී ගැනීමට අදාල ලංසු කැඳවීමේ ලේඛනවල සහ 2021 ජූලි 29 දිනැති අමාත්‍යමණ්ඩලය විසින් පත්කල ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අනුව, රෙදි සාම්පලවල ගුණත්වය පිලිබඳව රෙදිපිලි හා ඇගලුම් තාක්ෂණය පිළිබඳ පිළිගත් ආයතන 3 කින් ලබාගන්නා රසායනාගාර තත්ත්ව පරීක්ෂණ වාර්තාවන් මත පදනම්ව ලංසු ඇගයීම සිදුකරනු ලබන බව සඳහන්ව ඇතත්, ලංසු විවෘත කිරීමෙන් අනතුරුව එළඹි ප්‍රසම්පාදන කමිටු තීරණයක් අනුව එක් ආයතනයකින් පමණක් ලබාගත් තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් පදනම් කර ගෙන ලංසු ඇගයීම සිදුකර තිබුණි. | පිළිගත් එක් ආයතනයකින් සහ ක්ෂේත්‍ර පරීක්ෂාව තුලින් ලබා ගත් වාර්තා සැලකිල්ලට ගෙන සිදුකිරීමට 2021.08.11 වන දින පැවති අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් උපදෙස් ලබා දෙන ලදි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන් සහ කොන්දේසිවලට අනුකූලව කටයුතු කල යුතුවේ. |
| (ii) | රෙදි සාම්පලවල ගුණාත්මකභාවය ඇගයීම සඳහා පරාමිතීන් 18 ක් හඳුනාගෙන තිබුණු අතර ඉන් පරාමිතීන් 08 ක් ප්‍රධාන පරාමිතීන් ( Critical Parameters) ලෙස දක්වා තිබුණි. එහෙත් එසේ පරීක්ෂා කළයුතු ප්‍රධාන පරාමිතියක් (Dimensional Stability to Dry Cleaning) පරීක්ෂා කර නොතිබුණු අතර රෙදිපිළිවල ගුණාත්මකභාවය ඇගයීමේදී භාවිතා කරනු ලබන ප්‍රධානතම පරාමිතියක් පිළිබඳව ඇගයීමකින් තොරව ලබාගත් වාර්තාවක් පදනම්කර ගනිමින් තාක්ෂණික ඇගයීම සිදුකර තිබුණි. තවද මෙම පරීක්ෂාවට සමාන පරීක්ෂාවක් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් සිදුකර තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත්කර ඇතත් මෙම පරීක්ෂාව විද්‍යානුකූල පදනමක් මත පිළිගත් ආයතනයක් විසින් නිකුත්කළ වාර්තාවක් ලෙස පිළිගැනීම ගැටලු සහගත විය. | ඉදිරියේදී සිදු කරනු ලබන ප්‍රසම්පාදනයන්හි තත්ත්ව පරීක්ෂාවන් වෙනුවෙන් ගත වන කාලය සහ පිරිවැය සලකමින් පිළිගත් ආයතන 03කින් ලබා ගන්නා ලද තත්ව පරීක්ෂණ වාර්තා පදනම් කර ගෙන ඉදිරි කටයුතු සිදු කිරීමට අවශ්‍ය උපදෙස් අදාල ප්‍රසම්පාදන කමිටු වෙතින් ලබා ගෙන සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන් සහ කොන්දේසිවලට අනුකූලව කටයුතු කල යුතුවේ. |

**3.5 පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ආරක්ෂක මූලස්ථාන ඉදිකිරීම් ව්‍යාපෘතියට අයත් උප ගබඩාවක පැවති වයර් රෝල් 306 ක ප්‍රමාණයක් අස්ථානගතවී තිබුණු අතර ඒ වෙනුවෙන් හඳුනාගත් පාඩුව රු.793,688 ක් විය. මේ සම්බන්ධයෙන් වගකිවයුත්තන් නිශ්චය කර ඇතත් අදාල වටිනාකම අයකරගැනීමේ ඉදිරිකටයුතු සිදු කර නොතිබුණි. | 2022 නොවැම්බර් මස 16 වන දින නාවික හමුදා මූලස්ථානය වෙත අදාළ සේවා පුද්ගලයින්ගෙන් අයකර ගැනීමේ කටයුතු සිදුකරන ලෙස දන්වා යවා ඇත. ඒ අනුව 2023 මැයි මස 03 වන දිනැති ලිපිය මඟින් අදාළ වගකිව යුතු පාර්ශවයන්ගෙන් වාරික වශයෙන් අයකර ගැනීමට අවශ්‍ය අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලීම් ඉදිරිපත්කර ඇති අතර, ඒ සඳහා අනුමැතිය ලබාදීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | අලාභහානි අවම කර ගැනීම සඳහා සුදුසු පාලන පිලිවෙත් හඳුන්වාදියයුතු අතර අලාභහානි සඳහා වගකිවයුතු පාර්ශවයන් හඳුනාගැනීම හා අයකිරීමේ කටයුතු කඩිනමින් සිදුකල යුතුය. |
| (ආ) | ත්‍රිවිධ හමුදා මූලස්ථාන ව්‍යාපෘතියට අයත් EXPO OTDR Tester උපකරණය 2019 අප්‍රේල් 02 වන දින සිට අස්ථානගතවීමෙන් රු.2,077,328 ක අලාභයක් සිදුවී ඇතත්, එම අලාභයෙන් 2023 මැයි 03 දින වනවිටත් අයකරගෙන ඇති ප්‍රමාණය රු. 180,035 ක් පමණක් විය. | මෙම උපකරණය අස්ථානගත වීමෙන් සිදු අලාභහානි වටිනාකම අයකර ගැනීමේ ඉදිරි කටයුතු නාවික හමුදා මූලස්ථානය මඟින් සිදු කරන අතර, මේ වන විට රු.1,897,293 ක මුදලක් අයකර ගැනීමට නියමිතව ඇත. | අලාභහානි සම්බන්ධ අයකිරීම් කටයුතු කඩිනමින් සිදුකල යුතුය. |

**4. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික ශිෂ්‍යභට බලකායේ තනතුරු 70 ක් පුරප්පාඩුව පැවති අතර ගණකාධිකාරී හා පරිපාලන නිලධාරී යන තනතුරු පුරප්පාඩු හේතුවෙන් මූල්‍ය පාලන හා ආයතනික පරිපාලන කාර්යයන් කාර්යක්ෂමව ඉටුකර ගැනීම කෙරේ අහිතකරව බලපා තිබුණි. | ජාතික ශිෂ්‍යභට බලකාය ආයතන 42 කින් සමන්විත වන අතර, ස්ථිර සිවිල් සේවකයින් 91 ක් ද මු.රෙ.95 යටතේ සේවයේ නියුතු සිවිල් සේවකයින් 48 ක් ද බහුකාර්යය සේවය යටතේ බඳවාගෙන ඇති සේවකයින් 22 ක් ද මෙම බලකායේ රාජකාරිය සඳහා යොදවාගෙන ඇති අතර, ඔවුන්ගේ රාජකාරී කටයුතු ඉටු කිරීමේදී මෙම තනතුරු පුරප්පාඩු වීම හේතුවෙන් මූල්‍ය පාලන හා ආයතනික පරිපාලන කටයුතු කාර්යක්ෂමව ඉටුකර ගැනීමේ අපහසුතාවයට පත්ව ඇති බව දන්වා සිටිමි. | ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් පවත්වාගත යුතුය. |
| (ආ) | ජාතික ආරක්ෂක විද්‍යායතනය සඳහා අවශ්‍ය වියහැකි කාර්යය මණ්ඩලය නිශ්චය කිරීම, තනතුරු ඇති කිරීම, බඳවාගැනීමේ පරිපාටි සැකසීම හා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව ඇතුළු නිශ්චිත ආයතන මගින් අනුමැතිය | මෙම විද්‍යායතනය ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් ත්‍රිවිධ හමුදාවේ සහ පොලිස් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හට දැනුම ලබාදෙනු ලබන උසස් ආයතනයක් වන බැවින්, කොළඹ ප්‍රදේශයෙහි තදාසන්න සිවිල් ජන වපසරියක් තුල විද්‍යායතනය | අත්‍යාවශ්‍ය හා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් පවත්වාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලබාගැනීම ආදිය සිදුකළ බවට අනාවරණය නොවුණු අතර පරිපාලනමය කාර්යයන් සඳහා ත්‍රිවිධ හමුදාවන්හි නිලධාරීන් හා සෙසු නිලයන්ට අයත් 132 කින් යුත් කාර්ය මණ්ඩලයක් යොදවාගෙන තිබුණු අතර දැනට පවත්වනු ලබන පාඨමාලාවේ උපරිම ධාරිතාවය පුද්ගලයන් 40 ක් පමණක් වන බැවින් සාපේක්ෂව ඉහල පරිපාලනමය කාර්ය මණ්ඩලයක් සේවා නියුක්තකර ඇති බව නිරීක්ෂණය විය. | පිහිටීම හේතුවෙන් වෙනත් සිවිල් ආයතනයන් සේ ක්‍රියානොකර මෙම විද්‍යායතනයේ ආරක්‍ෂාව සම්බන්ධයෙන් හමුදා කඳවුරක ආකාරයට දිවා,රාත්‍රී ආරක්‍ෂක රාජකාරී කටයුතු සිදුකල යුතුය.<br>තවද, අධ්‍යාපනය ලබා ගැනීමට වඩාත් සුදුසු පරිසරයක් නිර්මාණය කිරීමේ අදහසින් ක්‍රමවත්ව හා අලංකාරව විද්‍යායතනය නඩත්තු කිරීම හා පවත්වා ගැනීම සිදුකිරීම සඳහා කාර්යය මණ්ඩල සේවා නියුක්ත කර ඇති බව පෙන්වා දෙමි. | |
| (ඇ) | අමාත්‍යාංශය හා ඒ යටතේ වන අනෙකුත් අංශවල රාජකාරි සඳහා ත්‍රිවිධ හමුදා කාර්යය මණ්ඩලය ලෙස නිලධාරීන් හා සෙසු නිළයන්ට අයත් හමුදා සාමාජිකයන් 700 ක් සේවා නියුක්ත කර තිබුණු අතර ඒ සඳහා වන පාරිශ්‍රමික අදාල ත්‍රිවිධ හමුදා විසින් දරා තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | අත්‍යවශ්‍ය හා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් පවත්වාගත යුතුය. |